# 25 වෙනත් දේව වන්දනාත්මක මෙහෙයන්

එඩ්මන් : පියතුමනි, ක්‍රිස්ටෝපර්ට පොඩි ප්‍රශ්නයක් තියෙනවාලු ඔබතුමාගෙන් අහන්න.

පියතුමා : මොකක් ද ක්‍රිස්ටෝපර්?

ක්‍රිස්ටෝපර් : පියතුමනි, ඊයේ අපේ ආච්චි අම්මා වන්දනාවේ ගිහින් ගෙදර ආවා. ඒ එන කොට මට බොරලික්කමක් දාපු මාලයක් ගෙනත් දුන්නා. මම ඒක කරේ දාගන්න හදන කොට ම හා ..... හා ..... පුතේ ..... බෙන්සාරු නොකර මාලේ කරේ දාන්න එපා කිව්වා. එතකොට අම්මා කිව්වා, ආච්චි අම්මා දුන්න දේව මෑණියන්ගේ සුරුවමත්, මාලේත් ඉරිදට බෙන්සාරු කරගනිමු කියලා. පියතුමනි, ඇයි අපි එහෙම කරන්නේ?

පියතුමා පුතේ, බොරලික්කම්, ආගමික පලදනා, සුරුවම් වගේ තවත් ගොඩාක් දේවල් අපි බෙන්සාරු කරලා එහෙම නැත්නම් ආශීර්වාද කරලා තමයි භාවිතයට ගන්නේ. ඒ හැම දෙයක් ම ශුද්ධ වූ සභාවේ වෙනත් දේව වන්දනාත්මක පිළිවෙත්වලට සම්බන්ධ යි.

ක්‍රිස්ටෝපර් : පියතුමනි, "වෙනත් දේව වන්දනාත්මක මෙහෙයන්" කියන්නේ මොනවට ද?

පියතුමා : හොඳයි, මම ඔයාලට හෙට දහම් පාසලේ දී මේ ගැන කියලා දෙන්නම්.

කිතුනු ජීවිතයේ එල නෙලා ගන්නටත් ජීවිතයේ විවිධ අවස්ථා ශුද්ධවත් කිරීමටත් වෙනත් දේව වන්දනාත්මක මෙහෙයන් උපකාරී වේ. පුද්ගලයන්, ආගමික භාණ්ඩ ආහාර හා ස්ථාන ආශීර්වාද කිරීම, පදක්කම් පැලඳවීම, ශුද්ධ වූ ධාතුවලට ගරු කිරීම යනාදිය මීට අයත් ය.

## එම මෙහෙයවල විශේෂ ලක්ෂණ

- රාජගුරුප්‍රසාදීවරුන්, පූජාප්‍රසාදීවරුන් හෝ තේවාචාර්යවරුන් විසින් නිල වශයෙන් මෙය ක්‍රියාවට නංවයි.
- ඇතැම් අවස්ථාවන්හි ගිහියන් ද මෙහි මූලිකත්වය ගනු ලබයි.
- ඇතැම් ආශීර්වාද දිගු කාලීනව වැදගත් වේ. (නිදසුන් : පුද්ගලයන් කැප කිරීම, ආගමික භාණ්ඩ හා පලදනා ජන වන්දනා කටයුතු සඳහා වෙන් කරමින් ආශීර්වාද කිරීම)



නොමිලේ බෙදහැරීම සඳහා ය.

- මෙම ආශීර්වාද කිරීම්වල දී අත් තැබීම, ශුද්ධ වූ කුරුසය සලකුණු කිරීම, ආශීර්වාදිත පැන් ඉසීම යනාදි සලකුණු කරමින් ආශීර්වාද කිරීම හා එයට සම්බන්ධ නිල යාච්ඤා භාවිත කරයි.
- ආධ්‍යාත්මික ප්‍රතිඵල දානය කරනු ලැබීම

(ක.ස.ධ 1667-1690)

ක්‍රිස්තියානි ජීවිතය පෝෂණය කරමින් තම දේශයට, සංස්කෘතියට ගැළපෙන ආකාරයෙන් මෙම පිළිවෙත් පවත්වා ගෙන යනු ලබයි. එසේ පවත්වා ගෙන යනු ලබන වත්පිළිවෙත් කිහිපයකි.

## ආශීර්වාද කිරීම

- පුද්ගලයන් හා ආගමික භාණ්ඩ ආශීර්වාද කිරීම මෙහි දී සිදුවේ.
- අවමංගල්‍ය පිළිවෙත්
  අවමංගල්‍ය මෙහෙයට සහභාගි වන සංසයේ එකමුතු සහභාගිත්වය මඟින් හා එම සංසයට අනන්ත ජීවිතය පිළිබඳ ව ප්‍රකාශ කිරීම මඟින්, මියගිය තැනැත්තාත් සමග සාර්ථක සම්බන්ධතාවක් ප්‍රකාශ කිරීම, සභාවේ ධර්ම සේවාව අරමුණ කරයි.

## ශුද්ධ වූ ධාතුවලට ගරු කිරීම

කිතුනු ජීවිතයේ ආධ්‍යාත්මිකත්වය පෙන්වන අවස්ථා ලෙස මෙය දැක්විය හැකි ය.

## පදක්කම් පැලඳවීම

පදක්කම් පැලඳවීම කිතුනු ජීවිතය හා බැඳි පවතින විශ්වාසයේ ක්‍රියාවලියකි.

ප්‍රසාද ස්නාපනය නම් සක්‍රමේන්තුව ලබා ගනිමින් කිතුනු ජීවිතයට ප්‍රවේශ වූ අප සැමගේ විශ්වාසය තව දුරටත් ශක්තිමත් කිරීමට මෙම පිළිවෙත් ඉවහල් වේ. එමෙන් ම මෙම වත්පිළිවෙත් ආශ්‍රිත ව සිදු කරනු ලබන සැම ආශීර්වාදයකින් ම දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීම හා උන්වහන්සේගේ වරප්‍රසාද ප්‍රාර්ථනා කිරීම සිදු වේ.

දෙවියන් වහන්සේ ද ක්‍රිස්තුන් වහන්සේ තුළින් කිතුනු අපට සැම ආකාරයක ම ආශීර්වාද බහුල ව දානය කරන සේක. එබැවින් කිතුනු අප මෙම පිළිවෙත්වලට විශ්වාසයෙන් හා බැතියෙන් සහභාගී වීමටත් ඒවා පවත්වා ගෙන යාමටත් සිත්හි තබා ගත යුතු ය.

**ක්‍රියාකාරකම**

1. වෙනත් දේව වන්දනාත්මක මෙහෙයවල දක්නට ලැබෙන ලක්ෂණ තුනක් ලියන්න.
2. එම මෙහෙය තුනක් නම් කරන්න.
3. "කිතුනු ජීවිතය ශක්තිමත් කිරීමට ඉවහල් වන වෙනත් දේව වන්දනාත්මක මෙහෙය" යන මාතෘකාව යටතේ බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරන්න.

**ජීවිතයට බිඳක්**

*ශුද්ධ වූ වස්තූන්ට ගරු කිරීමට යොමු වන්න.*